# හද රිදවන මතක සුවඳ



21

එම කරුණු කෙසේ වුවද දයා වන්නිආරච්චි සහෝදරයා පක්ෂයේ මුදල් එක ශත පහක් හෝ වංචා කළේ යයි පක්ෂය හෝ වෙනත් කිසිවෙක් නොකියති. අද පවා එසේ නොසිතති. ඔහු සවුත්තුවෙකැයි හෝ ද්‍රෝහියෙකැයි කිසිවෙක්ම නොපවසති. වන්නි සහෝදරයා පක්ෂයෙන් ගියා ගියාමය. පුවත්තකටවත් කිසිම දෙයක් නොකී ඔහු ගිලිගියේ මරණීය නිහැඩියාවකය.

පක්ෂයෙන් ගිය ඇතැමුන් පක්ෂයට මඩ හා අවලාද ගසන විට වර්තමානයේ පක්ෂයේ සිටින ජ්‍යෙෂ්ඨයන් වන්නි සහෝදරයා සිහිපත කරන්නේ මෙසේය.

“දැක්කනේ, වන්නි ගියා. අනම් මනම් මුකුත් නෑ. ඔහේ පාඩුවේ ඉන්නවා.” ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් තුළ පවතින දුර්ලභ ගුණාංගයක් නම් තමන්ට තියන දෙයක් පක්ෂයට දෙනවා විනා පක්ෂයේ මුදල් තඹ සතයක් හෝ වංචා නොකිරීම ය.

එහෙත් යම් යම් අවස්ථාවලදී පක්ෂයේ අරමුදල් සම්බන්ධයෙන් යම් යම් අඩුපාඩුකම් සිදු වී තිබේ.

ජනතා විමුක්ති පෙරමුණ අද තරමක් පොහොසත් පක්ෂයකි. එහි තේරුම අදින් වසර විස්සකට විසිපහකට පමණ පෙර එය මූල්‍යමය අතින් දුප්පත් පක්ෂයක්ව තිබූ බවයි. අද ජ.වි.පෙ. ට රුපියල් ලක්ෂ 10 ක හදිසි මුදලක් අවශ්‍ය විනිනම් ජ.වි.පෙ. පැරිස් ශාඛාවට හෝ වෙනත් ජාත්‍යන්තර ශාඛාවකට එම මුදල ලබා දිය හැකි ශක්තියක් තිබේ.

එතේ එකලදී ජ.වි.පෙ. ට ලන්ඩන් ශාඛාව හැර වෙනත් විදේශ ශාඛා නොතිබූ නිසාත්, තම මන්ත්‍රී වැටුප පක්ෂ අරමුදලට බැර කරන පාර්ලිමේන්තු මන්ත්‍රීන් හා පළාත් සභා මන්ත්‍රීන් සිය ගණනක් නොසිටි නිසාත් රුපියල් ලක්ෂ හයක් යනු අසීරුවෙන් හඹා යායුතු දුෂ්කර ඉලක්කයක් විය. පක්ෂය 1981 දී සංවර්ධන සභාවලට තරගකර මන්ත්‍රීවරුන් 13 දෙනෙකු පත්කර ගත්තත් පක්ෂ අරමුදල තුට්ටුවටම හිදී ගියේ ය. එම නිසා රුපියල් දශ ලක්ෂයක අරමුදලක් සෙවීමට පක්ෂය තීරණය කළේ එයට සමගාමීව මුළු රට පුරාම ප්‍රචාරක කටයුතු ද කළහැකි නිසා ය.

සුපුරුදු ලෙස ගෙන්ගෙට ගොස් ආධාර ඉල්ලීම, ටිකට්පත් අලෙවි කිරීම, කැටවලට මුදල් එකතු කිරීම ආදියෙන් දස ලක්ෂයේ අරමුදල් සෙවීම ආරම්භ කරන ලදී. මේ එක් එක් කාර්යය සඳහා උපන් හපන්කම් ඇති විශේෂඥ සහෝදර සහෝදරියෝ පක්ෂයේ උන්හ. ඇතැමෙකු කැමති වුයේ ගෙයින් ගෙට කැන්වසින් යාමටය. මෙසේ යන අතරතුර විරුද්ධ පාක්ෂික වාග් ප්‍රහාර හා මැර තර්ජනවලට ලක්වන අවස්ථාද වූහ. එහෙත් අප සහෝදරවරුන් එම සිදුවීම් තම විප්ලවවාදී ජීවිතයට භාවිතයෙන් ලැබෙන මහඟු අත්දැකීම් සේ සැලකුවෝය. තවෙකෙකු කැමති වුයේ ටිකට් පත් හා පුවත් පත් අලෙවිකිරීමටය. සමහරු කැමති වුයේ කැටවලට ආධාර මුදල් එකතු කිරීමටය. කවුරු කවුරුනුත් මේ කොයිදේ කළේත් පිළිවෙලට, පිරිසිදුවට ඇඳ පැලද ගෙනය. එය පක්ෂය විසින් අප හට දෙනලද විශේෂ උපදෙසකි.

> අප කැට සොලවමින් මහජනතාවගෙන් ආධාර ඉල්ලා සිටින කල අපගේ බෙලෙක්ක කැටවලට කාසි වැටිණ. රැවුම් ගෙරවුම් ද, නොලැබුණාම නොවේ. ඒ බොහෝ විට මාතර පුරවරයේ සිටි පැරණි කොමියුනිස්ට් පාක්ෂිකයන්ගෙනි. අප දෙදෙනාට නොදුරින් හිටගෙන උන් මැදිරියේ යාචකයකු කුහුලින් හා නොරිස්සුම් නෙතින් අප දෙස බලන බව මට දැනී තිබුණේ පැයක දෙකක තරම් සිටය. අවසානයේ ඔහු අප අසලටම ආවේය. ඔහුගේ ඇඹේනිය විය හැකි සිඟන්නියද, ඔහු අසලම විය.............

“ස හො ් ද ර ව රු ෙන ්”, සහෝදරියනේ, විප්ලවවාදියෙක් හෝ විප්ලවවාදිනියෙක් කියන්නේ හම්පඩ කලිසමකුයි, කඩමාළු කමිසයකුයි, ඒහෙම නැත්නම් සායම් ගිය චීත්ත ගවුමක් ඇදගෙන , රබර් සෙරප්පු කුට්ටමක් දාගත්තු , කොණ්ඩ රැවුල් වවාගෙන ඉන්න කෙට්ටු මිනිහෙකුට නෙවි. හැම අතින්ම දියුණු මිනිහෙකුට , ගැහැනියෙකුට, එයට බාහිර පෙනුමත් ඇතුළත්, අපේ දේශපාලනය ගැන කථා කරන්න අපි ජනතාව අතරට යනකොට මේ සහෝදරවරු, සහෝදරියෝ හොඳට පිරිසිදුව ඇඳලා, හොඳ පෙනුමට යන්න ඕන.”

පක්ෂයේ ලොකු සහෝදරවරු අපහට උපදෙස් දුන්නේ එසේය.

දස ලක්ෂයේ අරමුදල සඳහා කැටවලට මුදල් එකතු කරන්නට ගිය දිනවලදී සිදු වූ සිදුවීම් දෙකක් කිසිදු මගේ මතකයෙන් බැහැර නොයන්නකි.

අද වෛද්‍යවරයෙකු වී ඇති සහෝදරයෙකුත් මමත් කැටවලට මුදල් එකතු කරමින් හිටියේ මාතර ලන්දේසි කොටුවේ දොරකඩ අසල ය. ලන්දේසී බලකොටුව ඇතුළත වූ උසාවි වලට, පෙරකදෝරුවන්ගේ කන්තෝරුවලට, කච්චේරියට, මාතර හිරගෙදර සිටින අය බැලීමට වශයෙන් විශාල ජනකායක් කොටු දොරකඩින් ඇතුළු වෙති. පිටතට එති. මාතර ප්‍රධාන බස් නැවතුම් පොළද එතනම ය. එය පැහැබර දිනකි. නිල්වලා නදියත් , මහ මාවතත් අතර වූ තුන්හුලස් පටු බිම්කඩේ උසට වැඩී ඇති අතු ඉති වියනක් සේ විහිදුලු නුගගස් කිහිපයක් වෙයි. තෙල් බෙහෙත් වෙළෙන්දන්, මැජික් පෙන්වන්නන්, කයි කතන්දර කියන්නන් මේ නුගගස් සෙවණේ තම ව්‍යාපාර පවත්වා ගෙන ගියෙන් එම ගස් හැඳින්වුයේ ‘පච ගස්’ නමිනි.

අප කැට සොලවමින් මහජනතාවගෙන් ආධාර ඉල්ලා සිටින කල අපගෙ ” බෙලෙක්ක කැටවලට කාසි වැටිණ. රැවුම් ගෙරවුම් ද නොලැබුණාම නොවේ. ඒ බොහෝ විට මාතර පුරවරයේ සිටි පැරණි කොමියුනිස්ට් පාක්ෂිකයන්ගෙනි. අප දෙදෙනාට නොදුරින් හිටගෙන උන් මැදිරියේ යාචකයකු කුහුලින් හා නොරිස්සුම් නෙතින් අප දෙස බලන බව මට දැනී තිබුණේ පැයක දෙකක තරම් සිටය. අවසානයේ ඔහු අප අසලටම ආවේය. ඔහුගේ ඇඹේනිය විය හැකි සිඟන්නියද ඔහු අසලම විය.

“නොද්දකිං කලිසං බෑයවලුත් දාගෙන හිඟන හැටි” ගැහැණිය අපගේ මුහුණට ගසන්නාක් මෙන් පාර අයිනේ බොරළු පොළව මතට බුලත් කෙළ පහරක් විද හැරියාය.

“අපි ගිරිය කැඩෙනකන් දැඟිලි ගැහුවත් සත පහක් නොදෙන උන් බලහංකෝ ‘ටුං බුං’ ගාලා
අරවට කාසි දාන හැටි ?”

හිඟන්නා කිව්වේ ඇත්තටම විමතිය පළ කරමිනි.

“ඔය කඩමාළු එල්ලං හිටියට හිඟමන් හම්බු වෙන්නේ නෑ උඹත් කලිසං බෑයක් හොයා ගනිං.”

හිඟන්නිය මිනිහාට කිව්වේ ඇනුම් පදයක් ලෙසින්වත්, කෝපයකින්වත් නොව කම්පිත ස්වරයකිනි. මෙතෙක් වේලා මෙම සිද්ධිය ගැන අවධානයෙන් සිටි මට යම් හාස්‍ය රසයක්ද දැනෙමින් තිබුණත් මගේ පපුව පිච්චී ගියේ එම මොහොතේදී ය.

“අපි මෙතන හිටියොත් මේ මිනිස්සු අද බඩගින්නේ යමු වෙන තැනකට” මම මගේ සගයාට කීවෙමි.

දෙවැනි සිද්ධිය දින මා හිටියේ ඊ.එච්.කුරේ ලී බඩු ප්‍රදර්ශනාගාරය ළඟ මංසන්ධියේ තනිවම ය. මාතර පොලීසිය දෙසින් පැමිණ පාර මාරු වී මා අසලින් යන්නට ආ හොඳින් ඇඳ පැලඳ උන් මහත්වරුන් දෙදෙනාට කැටය පා මා සිලිං බිලිං ගා බෙලෙක්ටින් කැටය හොලවා ආධාරයක් කරන්නැයි ඉල්ලා සිටියේ ඔවුන් දෙදෙනා කවුරුන්දැයි හඳුනාගෙනමය. අපගේ නෙත් හය එකට ගැටෙමින් තිබුණේ තත්පර කිහිපයකි. එක් මහත්මයෙකු සිය අත්ල නළලේ ගසා ගත්තේ ය.

“අයියෝ මුණේ, මේ මොකක්ද උඹට වෙලා තියෙන්නේ ? ඇයි මේ උඹ හිඟා කන්නේ ? අපි හිතුවේ උඹ හොඳ බිස්නස් කාරයෙක් වෙලා ඇති කියලා. මොකද උනේ උඹලාගේ හෝටලේ බංකොලොත් උනාද ?”

එක් පාසල් මිතුරෙකු එසේ කියාගෙන යද්දී අනෙකා ගොලුවුවාක් මෙන් බලා සිටියේ ය. “හැමෝම රස්සාවල් කරලා හරියන්නේ නැහැනේ. මෙන්න මේ කැටේට කීයක් හරි දාන්න.”

“විසිකරපං බං ඕක අර කාණුවට. වරෙන් යන්න අපි එක්ක. යකෝ එක කොලේජ් එකේ, එක ක්ලාස් එකේ හිටපු උඹට පාරේ හිඟාකන්න දෙන්න පුළුවන්ද ?”

“මම මේ හිඟා කනවා නෙවි මචං. අපේ පක්ෂයට ආධාර එකතු කරනවා. අර ඉන්නේ තව කට්ටිය”
මම මිත්‍රයාට තත්ත්වය පැහැදිලි කර දුන්නෙමි.

“යකෝ, මුහුණේ එක මයිලක් නැතිවෙන තුරු ෂේව් එක දාලා කෙඩෙට්ටං කරපු එකා මුහුණපුරා පත රැවුලක් වවාගෙන හිඟන කැටයක් හෙලෙව්වම කව්ද නොරැවටෙන්නේ?”

එසේ කී මිතුරන් දෙදෙනා පිටව ගියේ තරමක ආධාරයක් මෙන්ම අතීත සිද්ධියක් සිහිපත් කර මට අවවාදයක් ද කරමිනි.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට